කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

**වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමු වසර පරීක්ෂණය (බාහිර) - 2014**

2019 - ජූනි/ජූලි


**B COM E 1025 – සූක්ෂම ආර්ථික විද්‍යාව**

ප්‍රශ්න සංඛ්‍යාව - හයයි (06) කාලය : පැය තුනයි (03)

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න

---

ප්‍රශ්න අංක 01

අ. "සියළුම ආර්ථික ප්‍රශ්නවල මූලික තර්කය හිඟකම වේ." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වේද ? ඔබගේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. i. "සෑම ආර්ථිකයකම කුමක් නිෂ්පාදනය කරණවා ද?" යන්න පොදු ගැටලුවක් වන්නේ ඇයි ?

(ලකුණු 05)

ii. නිදහස් ආර්ථික ක්‍රමයක මිල යන්ත්‍රණය මෙම ගැටලුව විසඳන්නේ කෙසේද ?

(ලකුණු 05)

ඇ. සාර්ව ආර්ථික විද්‍යාව සහ සුක්ෂම ආර්ථික විද්‍යාව අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 02

අ. පූර්ණ තරඟකාරී තත්වයක් යටතේ උපකල්පිත ආර්ථිකයක නිෂ්පාදිත භාණ්ඩයක පහත සැපයුම් හා ඉල්ලුම් ශ්‍රිතයන් පහත දී ඇත.

$$Q^{d} = 7000 - 20\,p$$
$$Q^{s} = 250 + 25\,p$$

(ලකුණු 05)

ආ. රජයක් විසින් කරනු ලබන සමහර භාණ්ඩ වල මිල පාලනය යථාර්ථවාදී නොවන්නේ මන්ද ?

(ලකුණු 05)

ඇ. i. සංඛ්‍යා සූචක සහ ක්‍රම සූචක උපයෝගිතාවය අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ii. උපේක්ෂා වක්‍රයක ගුණාංග විස්තර කරන්න.

(ලකුණු 05)
(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 03

අ. මිල ඉල්ලුම් නම්‍යතාවය තීරණය කරන සාධක කවරේද ?

(ලකුණු 05)

ආ. උපකල්පිත ආර්ථිකයක ඉල්ලුම් ලේඛණය පහත දී ඇත.

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මිල (රුපියල්) | 150 | 120 | 90 | 60 | 30 | 0 |
| ප්‍රමාණය | 150 | 300 | 450 | 600 | 750 | 900 |

i. මිල රුපියල් 150 සිට 120 දක්වා පහල ගියහොත් නම්‍යතාව සොයන්න.

ii. මිල රුපියල් 90 සිට 120 ඉහල ගියහොත් නම්‍යතාව ගණනය කරන්න.

(ලකුණු 05)

ඇ. පහත දක්වෙන එකිනෙක නිෂ්පාදන වල හරස් ඉල්ලුම් නම්‍යතාව ධන හෝ ඍන වේදැයි ඔබ අපේක්ෂා කරන්නේ ද ? පැහැදිලි කරන්න.

i. පෞද්ගලික පරිගණක හා මෘදුකාංග

ii. තේ හා කෝපි

iii. ඇලුමිනියම් හා යකඩ

iv. ටෙනිස් පිති හා ටෙනිස් බෝල

(එකකට ලකුණු 2.5 බැගින් )
(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 04

අ. i. ව්‍යාපාරික ආයතනයක අරමුණ ලාභ උපරිම කිරීම යන්නට විරුද්ධව ඇති තර්ක මොනවාද ?

(ලකුණු 06)

ii. සාමාන්‍ය ස්ථාවර පිරිවැය සහ ආන්තික පිරිවැය යන්නෙහි අදහස හා වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. i. ආර්ථික පිරිවැය සහ ගිණුම්කරණ පිරිවැය අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii. වෙළඳපොල ආකෘතියක් යන්නෙහි අදහස කුමක්ද ?

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 05

අ. "පූර්ණ තරඟකාරී තත්වයකදී විකුණුම්කරුවකු මිල ගන්නෙකු වන අතර මිල තීරණය කරන්නෙකු නොවේ." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ. "ඒකාධිකාරී තරඟය පූර්ණ තරඟකාරී හා ඒකාධිකාරීය අතර අතරමැදි තත්වයකි." ඔබ මෙම ප්‍රකාශයට එකඟ වන්නේද ? ඔබගේ ප්‍රකාශය තහවුරු කිරීමට හේතු ලබා දෙන්න.

(ලකුණු 06)

ඇ. i. කතිපයාධිකාරී වෙළඳපලක ගුණාංග පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. භාණ්ඩ ප්‍රභේදනය යනු කුමක්ද ?

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

ප්‍රශ්න අංක 06

පහත දෑ සඳහා කෙටි සටහන් ලියන්න.

i. පොදු භාණ්ඩ
ii. කෙටිකාලීන හා දිගුකාලීන
iii. හීන වන ආන්තික ඵලදාව
iv. සම නිෂ්පාදන වක්‍ර
v. නිෂ්පාදන ප්‍රසාරණ මාර්ගය

(එකකට ලකුණු 4 බැගින්)

(මුළු ලකුණු 20)